# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1658/36 - 2010 ජුනි මස 17 වැනි බ්‍රහස්පතින්දා - 2010.06.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. – බී. 21/78.

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

27 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන අමාත්‍ය, දිසානායක මුදියන්සේලාගේ සුමනවීර බන්ඩා දිසානායක වන මම, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය මත මේ නියමය මගින් (2009 මැයි මස 29 වැනි දින අංක 1603/49 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමය මගින් අවසන් වරට සංශෝධිත ) එකී පනතේ 139 වැනි වගන්තියේ විධිවිධාන ප්‍රකාරව, ඉහත කී පනතේ 21 වැනි වගන්තිය යටතේ සාදන ලද නියමයක් ලෙස සලකනු ලැබිය යුතු සහ කොළඹ විශ්ව විද්‍යාලය පිහිටුවනු ලැබූ නියමයේ උපලේඛනයේ I වැනි තීරයේ (පීඨය) දැක්වෙන “ශාස්ත්‍ර පීඨය ” යන අයිතමයට අනුරූපව එම උපලේඛනයේ II වැනි තීරයේ දැක්වෙන සියලු අයිතම ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන අයිතම ආදේශ කිරීමෙන් එම නියමයේ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ. :—

“උපලේඛනය

| *I වැනි තීරය*<br>***පීඨය*** | *II වැනි තීරය*<br>***අධ්‍යයන අංශ*** |
|---|---|
| ශාස්ත්‍ර පීඨය | 1. ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය |
| | 2. ඉංග්‍රීසි අධ්‍යයන අංශය |
| | 3. භූගෝල විද්‍යා අධ්‍යයන අංශය |
| | 4. ප්‍රජා විද්‍යා අධ්‍යයන අංශය |
| | 5. ඉතිහාසය අධ්‍යයන අංශය |
| | 6. ජාත්‍යන්තර සම්බන්ධතා අධ්‍යයන අංශය |
| | 7. දේශපාලන විද්‍යාව හා රාජ්‍ය ප්‍රතිපත්ති අධ්‍යයන අංශය |
| | 8. සිංහල අධ්‍යයන අංශය |
| | 9. සමාජ විද්‍යා අධ්‍යයන අංශය.”. |

දිසානායක මුදියන්සේලාගේ සුමනවීර බන්ඩා දිසානායක,
උසස් අධ්‍යාපන අමාත්‍ය.

2010 ජුනි මස 08 වැනි දින,
කොළඹ,
උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.

07-137/1

එල්. ඩී. – බී. 21/78.

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

27 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන අමාත්‍ය, දිසානායක මුදියන්සේලාගේ සුමනවීර බන්ඩා දිසානායක වන මම, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය මත මේ නියමය මගින් (2009 මැයි මස 28 වැනි දින අංක 1603/35 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමය මගින් අවසන් වරට සංශෝධිත ) එකී පනතේ 139 වැනි වගන්තියේ විධිවිධාන ප්‍රකාරව, ඉහත කී පනතේ 21 වැනි වගන්තිය යටතේ සාදන ලද නියමයක් ලෙස සලකනු ලැබිය යුතු සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය පිහිටුවනු ලැබූ නියමයේ උපලේඛනයේ I වැනි තීරයේ දැක්වෙන "පීඨ" යන ශීර්ෂය යටතේ දැක්වෙන "කළමනාකරණ සහ වාණිජ පීඨය" යන අයිතමයට අනුරූපව, එම උපලේඛනයේ II වැනි තීරයේ "අධ්‍යයන අංශ" යන ශීර්ෂය යටතේ දැක්වෙන II වැනි අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අයිතමය එකතු කිරීමෙන්, එම නියමයේ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ. :—

"12. ව්‍යවසායකත්ව අධ්‍යයන අංශය ".

දිසානායක මුදියන්සේලාගේ සුමනවීර බන්ඩා දිසානායක,
උසස් අධ්‍යාපන අමාත්‍ය.

2010 ජුනි මස 08 වැනි දින,
කොළඹ,
උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.
07-137/2

---

එල්. ඩී. – බී. 21/78.

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

27 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන අමාත්‍ය, දිසානායක මුදියන්සේලාගේ සුමනවීර බන්ඩා දිසානායක වන මම, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය මත මේ නියමය මගින් (2009 ජුනි මස 16 වැනි දින අංක 1606/10 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමය මගින් අවසන් වරට සංශෝධිත ) එකී පනතේ 139 වැනි වගන්තියේ විධිවිධාන ප්‍රකාරව, ඉහත කී පනතේ 21 වැනි වගන්තිය යටතේ සාදන ලද නියමයක් ලෙස සලකනු ලැබිය යුතු සහ යාපනය විශ්ව විද්‍යාලය පිහිටුවනු ලැබූ නියමයේ උපලේඛනයේ I වැනි තීරයේ දැක්වෙන "වෛද්‍ය විද්‍යා පීඨය" යන අයිතමයට සහ ඊට අනුරූපව එම උපලේඛනයේ II වැනි තීරයේ දැක්වෙන අයිතමවලට ඉක්බිතිව ම පහත දැක්වෙන අයිතමය එකතු කිරීමෙන්, එම නියමයේ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ. :—

**"උපලේඛනය**

| *I වැනි තීරය* **පීඨය** | *II වැනි තීරය* **අධ්‍යයන අංශ** |
|---|---|
| කළමනාකරණ සහ වාණිජ පීඨය | 1. ගිණුම්කරණ අධ්‍යයන අංශය |
| | 2. මානව සම්පත් කළමනාකරණ අධ්‍යයන අංශය |
| | 3. අලෙවිකරණ අධ්‍යයන අංශය |
| | 4. මූල්‍ය කළමනාකරණ අධ්‍යයන අංශය.". |

දිසානායක මුදියන්සේලාගේ සුමනවීර බන්ඩා දිසානායක,
උසස් අධ්‍යාපන අමාත්‍ය.

2010 ජුනි මස 08 වැනි දින,
කොළඹ,
උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.

07-137/3

එල්. ඩී. – බී. 21/78.

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

27 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන අමාත්‍ය, දිසානායක මුදියන්සේලාගේ සුමනවීර බන්ඩා දිසානායක වන මම, මේ නියමය මගින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය මත කලින් කල සංශෝධිත නැගෙනහිර විශ්ව විද්‍යාලය පිහිටුවනු ලැබූ, 1986 සැප්තැම්බර් මස 26 වැනි දින හා අංක 420/25 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමය සහ අවසන් වරට 2007 නොවැම්බර් මස 14 වැනි දින අංක 1523/16 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමය මගින් සංශෝධිත, ඉහත කී පනතේ 21 වැනි වගන්තිය යටතේ සාදන ලද නියමයේ උපලේඛනයේ "කලා සහ සංස්කෘතික පීඨය" යන අයිතමයට අනුරූපව, එම උපලේඛනයේ II වැනි තීරයේ දැක්වෙන අයිතමවල 8 වැනි අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන් එම නියමයේ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ. :—

"9. ඉතිහාසය අධ්‍යයන අංශය ".

දිසානායක මුදියන්සේලාගේ සුමනවීර බන්ඩා දිසානායක,
උසස් අධ්‍යාපන අමාත්‍ය.

2010 ජුනි මස 08 වැනි දින,
කොළඹ,
උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.
07-137/4

---

එල්. ඩී. – බී. 21/78.

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

27 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන අමාත්‍ය, දිසානායක මුදියන්සේලාගේ සුමනවීර බන්ඩා දිසානායක වන මම, මේ නියමය මගින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය ඇතිව, කලින් කල සංශෝධිත රජරට විශ්ව විද්‍යාලය හා සම්බන්ධ වූ 1995 නොවැම්බර් මස 07 වැනි දින හා අංක 896/2 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළවූ නියමය සහ 2009 ජුනි මස 23 වැනි දින අංක 1607/13 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමය මගින් අවසන් වරට සංශෝධිත, ඉහත කී පනතේ 21 වැනි වගන්තිය යටතේ සාදන ලද නියමය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඉහත කී නියමයේ (iv) වැනි ඡේදයේ 3 වැනි අයිතමය වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන් :-

"3. කෘෂිකර්ම පීඨය ".

(2) ඉහත කී නියමයේ උපලේඛනයේ I වැනි තීරයේ "කෘෂිකර්ම පීඨය" යන අයිතමය වෙනුවට සහ එහි II වැනි තීරයේ (අධ්‍යයන අංශ) ඊට අනුරූපීව දැක්වෙන සඳහන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :-

| "*I වැනි තීරය* **පීඨය** | *II වැනි තීරය* **අධ්‍යයන අංශ** |
|---|---|
| කෘෂිකර්ම පීඨය | 1. ශාක විද්‍යා අධ්‍යයන අංශය |
| | 2. කෘෂිකර්ම පද්ධති අධ්‍යයන අංශය |
| | 3. පාංශු සහ ජලසම්පත් කළමනාකරණ අධ්‍යයන අංශය.". |

දිසානායක මුදියන්සේලාගේ සුමනවීර බන්ඩා දිසානායක,
උසස් අධ්‍යාපන අමාත්‍ය.

2010 ජුනි මස 08 වැනි දින,
කොළඹ,
උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.
07-137/5

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.